## 6. අනාත්ම ලක්ෂණය පිළිබඳව දත යුතු කරුණු

**පසුගිය ලිපිවලින් අපි ත්‍රිපිටක පෙළ අර්ථකථා ටීකාවන්හි අනිත්‍ය දුක්ඛ ලක්ෂණයන් සඳහා දක්වන ලද අර්ථකථනයන් විස්තර කළෙමු. මෙම ලිපියෙන් අපි අනාත්ම ලක්ෂණය පිළිබඳව ත්‍රිපිටක පෙළ අර්ථකථා ටීකාවන්හි දක්වන ලද අර්ථකථනයන් විස්තර කරන්නෙමු.**

බුදුරජාණන් වහන්සේ ලොව පහළ නොවූ කල්හි ද පණ්ඩිත මනුස්සයෝ සංස්කාරයන්ගේ අනිත්‍ය දුක්ඛ ලක්ෂණයන් දැන ගැනීමට සමත් වෙති. නමුදු අනාත්ම ලක්ෂණය දැක ගැනීමට සමත් නොවෙති. මහාබෝධිසත්ත්වයෙක් ම ලෝක සත්ත්වයා කෙරෙහි කරුණාවෙන් ලොව්තුරා බුදු බවට පැමිණ අනාත්ම ලක්ෂණය ලොවට ප්‍රකට කරවන්නේය. ආත්ම දෘෂ්ටියෙහි දැඩිව බැසගත් සත්ත්වයාට අනාත්ම ලක්ෂණය දැකීමට දුෂ්කරය. ආත්ම ලක්ෂණය පිළිබඳව පෙළ අර්ථකථාවන්හි මෙසේ සඳහන් වේ.

### I. පටිසම්භිදාමග්ගප්පකරණය - ලක්ඛණත්තික නිද්දේසය

- **"රූපං අනත්තා අසාරකට්ඨෙන"**

  [රූපය ආසාරක අර්ථයෙන් අනාත්මය (පටිසම්භිදාමග්ගප්පකරණ - ලක්ඛණත්තික නිද්දේසය - බු.ජ.මු. 68)]

මෙයට අර්ථ සපයන පටිසම්භිදාමග්ග අට්ඨකථාචාරීන් වහන්සේ මෙසේ දක්වයි

- **"අනත්තා අසාරකට්ඨෙනාති "අත්තනි වසීකාරකො වෙදකො සයංවසී"ති එවං පරිකප්පිතස්ස අත්තසාරස්ස අභාවෙන අනත්තා. යං හි අනිච්චං දුක්ඛං, අත්තනොපි අනිච්චතං වා උදයබ්බයපීළනං වා ධාරෙතුං න සක්කොති, කුතො තස්ස කාරකාදිභාවො. වුත්තඤ්ච "රූපඤ්ච හිදං, භික්ඛවෙ, අත්තා අභවිස්ස, නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍යා"තිආදි. "අත්තසාරනිච්චසාරවිරහිතත්තා අනත්තා"ති එකෙ"**

[අනත්තා අසාරකට්ඨෙන යනු තමා කෙරෙහි වූ වශීකාරකයෙක් විඳින්නෙක් මැඩපවත්වන්නාවූ අයෙක් ඇත්තේය යන මෙසේ වූ පරිකල්පිත ආත්මසාරයාගේ අභාවයෙන් අනත්ත නම් වේ. යම් අනිත්‍ය වූ දුක් වූ ධර්මයක් තෙමේ ද අනිත්‍ය භාවය හෝ  හටගැනීම් බිඳීම් වලින් පෙලනභාවය හෝ දරන්නට නොහැකිවෙයි ද. ඒ අනාත්ම ධර්මයට කාරක ආදීභාවයක් කොයින්ද? එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් "මහණෙනි මේ රූපය ආත්ම වන්නේ නම් මේ රූපය ආබාධවීම පිණිස නොපවතින්නේය" යන ආදිය වදාළ සේක. එබැවින් මෙහි අනත්ත යනු ආත්මසාර නිත්‍යසාර විරහිත බැවිනි. (පටිකම්භිදාමග්ගඅට්ඨකථා - ලක්ඛණත්තික නිද්දේසය - හේ.මු. 99)]

ලෝකයේ තමන් කැමති දේ කැමති ලෙස පවත්නා අයවළුන්ට වශීකාරක යයි කියති. ලෝකයේ මන්ත්‍ර ගුරුකම් ආදියෙන් පුද්ගලයන් තමා කැමති විදිහට පවත්වන්නවුන්ට වසීකාරක යයි කියනු ලැබේ මේ පංචඋපාදානස්කන්ධය එලෙස කැමති විදියට පවත්වන්වූ අයෙක් මේ තුළ නොමැති බැවින් ස්කන්ධයන්ට වසීකාරක නොවන අර්ථයෙන් අනාත්ම යයි කියනු ලැබේ.

ලෝකයේ සත්ත්‍වයෝ මම දුක් විදිමි මම සැප විදිමි යනාදී වශයෙන් විදින පුද්ගලයකුගේ විද්‍යාමාන බවක් ප්‍රකාශ කරති. නමුදු මේ පංචඋපාදානස්කන්ධය තුළ වේදනූපාදානස්කන්ධයක් ඉපිද නිරුද්ධ වනවා මිස ඒ තුළ විඳීමේ ක්‍රියාව කරන පුද්ගලයකු නැති බැවින් ස්කන්ධයන්ට විඳින්නෙකු නොවන අර්ථයෙන් අනාත්ම යයි කියනු ලැබේ.

ලෝකයේ ඇතැමෙක් ලෝකය මැවූ සියල්ලන් මැඩපවත්වන්නාවූ සර්වබලධාරී දෙවියෙක් බ්‍රහ්මයෙක් ඇතැයි කියන්නේය. මේ පංචුපාදානස්කන්ධය තුළ එසේ වූ ස්කන්ධයෝ මැඩපවත්වන්නෙක් නැති බැවින් මැඩ පවත්වන්නෙකු නොමැති අර්ථයෙන් ස්කන්ධයන් අනාත්ම යයි කියනු ලැබේ.

පංචස්කන්ධයන්ගේ මේ අනාත්ම ස්වභාවය දක්නාවූ තථාගතයන්වහන්සේ මේ පංචුපාදානස්කන්ධය තුළ තමන් කැමති ලෙස ස්කන්ධයන් හසුරුවන්නා වූ කාරකයෙක් සිටී නම් කායික මානසික රෝගයන් ඉපදීමට නොහැකි වන්නේ යැයි වදාළසේක. ඒ එබන්දෙක් සිටියේ වී නම් රෝග ඇතිවීම වළක්වා ගත හැකි බැවින.

එබැවින් සියලු සංස්කාර ධර්මයෝ වසීකාරක වේදක මැඩපවත්වන සත්ත්‍ව පුද්ගල ආත්ම සාරයෙන් ද ඉපදීම් බිඳීම් දෙකින් නොයුක්ත නොපෙරළෙන ස්වභාව සංඛ්‍යාත නිත්‍ය සාරයෙන් ද විරහිත බැවින් අනාත්ම වන්නාහ.

## II. විශුද්ධිමාර්ගයේ මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි නිර්දේශය

තවද විශුද්ධිමාර්ගයේ මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි නිර්දේශයෙහි මෙසේ සඳහන් වේ.

❖ **“යස්මා ච “උප්පන්නා සඞ්ඛාරා ඨිතිං පාපුණන්තු, ඨානප්පත්තා මා ජීරන්තු, ජරප්පත්තා මා භිජ්ජන්තූ”ති ඉමෙසු තීසු ඨානෙසු කස්සචි වසවත්තිභාවො නත්ථි, සුඤ්ඤා තෙන වසවත්තනාකාරෙන, තස්මා සුඤ්ඤතො, අස්සාමිකතො, අවසවත්තිතො, අත්තපටිපක්ඛතො ච අනත්තාති”**

[එසේම යම්හෙයකින් උපන්නාවූ සංස්කාරයෝ ඨීතියට පැමිණෙත්වා ඨීතියට පැමිණි සංස්කාරයෝ ජරාවට නොයත්වා, ජරාවටගිය සංස්කාරයෝ නොබිඳෙත්වා යනුවෙන් මේ තුන් ස්ථානයන්හි කිසියම් තම වසඟයෙහි පවත්වන බවක් නැත. එබඳු වූ වසඟයෙහි පවත්වන බවකින් ස්කන්ධයෝ ශූන්‍ය හ. හිස් ය.

එබැවින් සියලු සංස්කාර ධර්මයෝ ශූන්‍ය බවින් අස්වාමිකබවින් වසඟයෙහි නොපවත්වන්නා බැවින් ආත්ම ප්‍රතිපක්ෂ හෙයින් අනාත්මයහ. (විශුද්ධිමාර්ගය - හේ.මු. 464)]

මේ අනුව සංස්කාරයෝ වසඟයෙහි පවත්වන්නාවූ අයවළුන් නොමැති බැවින් ශූන්‍යහ. හිස් ය. සංස්කාරයන් තුළ ස්වාමීභාවයක් නැති හෙයින් නොහොත් දාසයන්ට ස්වාමියෙකු මෙන් සංස්කාරයන්ට ස්වාමීභාවයෙන් ක්‍රියාකරන සත්ත්වයකු පුද්ගලයෙකු නැති හෙයින් සංස්කාරයෝ අස්වාමිකයහ. වසඟයෙහි පවත්වන සත්ත්වයකු පුද්ගලයෙකු නැති බැවිනි සංස්කාරයෝ අවශවර්තීහුය. එබැවින් සත්ත්ව පුද්ගල ආත්මභාවයනට ප්‍රතිපක්ෂ ශූන්‍ය අස්වාමික අවශ්වර්තික සියළු සංස්කාරයෝ අනාත්මයහ.

## III. ධම්මපදාර්ථකතාව

තවද ධම්මපදාර්ථකතාවෙහි මග්ග වග්ගයෙහි ''සබ්බෙ ධම්මා අනත්තාති'' යන ගාථාවට ලියන ලද විස්තර වර්ණනාවෙහි මෙසේ දැක්වේ,

- **''අනත්තාති ''මා ජීයන්තු මා මීයන්තූ''ති වසෙ වත්තෙතුං න සක්කාති අවසවත්තනට්ඨෙන අත්තසුඤ්ඤා අස්සාමිකා අනිස්සරාති අත්ථො.''**

[අනත්තා යනු නො දිරාවා නො මියේවා යනුවෙන් වසඟයෙහි පැවැත්වීමට නොහැකිය යි අවසඟ පවත්වන අර්ථයෙන් ආත්ම ශූන්‍යයහ අස්වාමිකයහ අනීශ්වරයහ යන අර්ථයයි. (ධම්මපදට්ඨකථා 2 - හේ.මු. 540)]

පෙර කී ක්‍රමයෙන් වසඟයෙහි පැවැත්විය නොහැකි හෙයින් සත්ත්ව පුද්ගල ආත්ම ස්වභාවයන්ගෙන් ශූන්‍ය වූ සිස් වූ ස්වාමිභාව රහිතවූ සංස්කාරධර්මයෝ සර්වබලධාරී දෙවියකු මැවුම්කාර බ්‍රහ්මයකු සක්විති රජකු සෙස්සන්ට අධිපතිකම් ඊශ්වරකම් කරන්නා සේ අධිපතිබවත් ඊශ්වරබවත් කරන්නාවූ සත්ත්ව පුද්ගල ආත්ම ස්වභාවයන්ගෙන් යුක්ත නොවන හෙයින් අනාත්මය යන්න මෙයින් මතු කරයි.

මේ ආකාරයට පංචඋපාදානස්කන්ධ ධර්මයන් විවිධ ක්‍රමයෙන් අනාත්ම ලෙස දකින්නහුට මමය සත්ත්වයාය පුද්ගලයාය කියා දරන්නට කිසිවක් මේ තුළ නැතැයි යන අවබෝධයට පැමිණේ. මේ ඥාණ දර්ශණය ඒ පුද්ගලයාගේ ස්කන්ධ කෙරෙහි බැසගෙන ඇත්තාවූ විසිවැදෑරුම් සක්කායදිට්ඨීය ප්‍රහාණයට හේතු වේ. මෙසේ ක්‍රමයෙන් ආත්ම දිට්ඨීය ක්ෂය වන්නා වූ තැනැත්තාට සංස්කාරයන්ගෙන් ඇති ශූන්‍යතාවය හිස්බව වැටහෙන්නට පටන්ගනී. සංස්කාරයන්ගේ හිස් බවත් ආදීනවයත් දකින්නහුට සංස්කාරයන් කෙරෙහි කලකිරීම හෙවත් නිබ්බිදාව උපදී. ඒ තැනැත්තාට ඉන්පසු සංස්කාරයන් කෙරෙන් මිදීමේ බලවත් කැමැත්තක් උපදී. ඒ බලවත් කැමැත්ත ඒ පුද්ගලයාට සංස්කාරයන්ගෙන් තොරවූ නිර්වාණය සාක්ෂාත් කර ගැනීමට හේතු වන්නේය.

මෙතෙකින් ත්‍රිලක්ෂණය ගැන කළ සංක්ෂිප්ත විස්තරය අවසන් වන්නේය. කියන ලද ක්‍රමයෙන් ත්‍රිලක්ෂණයට නංවමින් නාම-රූප සම්මර්ශනය කරමින් නිවන් මාර්ගය වඩන ආකාරය භාග්‍යවතුන්වහන්සේ විසින් විවිධ සූත්‍රවල දේශනා කොට වදාළ ආකාරය මීළඟ ලිපියෙන් විස්තර කරන්නෙමු.